# 18

# අල්-කුලෆාඋර් රාෂිදූන් කලීෆා අබූබක්ර් සිද්දීක් රළියල්ලාහු අන්හු තුමා

فَعَلَيْكُمْ بِسُنَّتِي ، وَسُنَّةِ الْخُلَفَاءِ الرَّاشِدِينَ الْمَهْدِيِّينَ ، فَتَمَسَّكُوا بِهَا،
وَعَضُّوا عَلَيْهَا بِالنَّوَاجِذِ. (رواه أحمد)

**"මගේ සුන්නාව සහ සෘජු මාර්ගයේ ගිය කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ සුන්නාහ්ව ද හක්කෙ දත්වලින් දැඩි ව අල්ලා ගන්නා ලෙස ඔබට අණ කරමි."**
**(අහ්මද්)**

## අල් කුලෆාඋර් රාෂිදූන්වරු

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වෆාතයෙන් පසු ව පාලනයට පත් වූ පාලකයන් වන සහාබාවරුන් හතරදෙනා කුලෆාඋර් රාශිදූන්වරු යැයි හඳුන්වනු ලබති.

මොවුන්ගේ පෞද්ගලික, පවුල්, ආගමික, සමාජ, දේශපාලනික, අධ්‍යාපන, සංස්කෘතික කටයුතු සියල්ල අල්ලාහ්ගේ තෘප්තිය පතා වූ බව ද, ඔහුගේත් ඔහුගේ දූතයානණ්ගේ ද මඟපෙන්වීම අනුව සෘජු ව ද පරාර්ථකාමී ව ද පැවතුණි. මේ නිසා ඔවුන් කුලෆාඋර් රාෂිදූන්වරුන් බව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා පූරෝකථනය කර ඇත.

ඒ නිසා ඔවුන්ගේ චරිත ගැන දන ඔවුන්ගේ ආදර්ශය පිළිපැද හැසිරීම අවශ්‍ය ය. මුලින් ම ප්‍රථම කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා පිළිබඳ සළකා බලමු.

# කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු

අබ්දුල්ලා ඉබ්නු අබී කුහාෆා යන ස්වාභාවික නමින් යුත් මෙතුමාණෝ ක්‍රි. ව. 573 දී මක්කාවේ ඉපදුණහ. ජාහිලියියා යුගයේ දී වැදගත් ව්‍යාපාරිකයෙකු හා සමාජයේ පිළිගන්නා වූ නායකයන්ගෙන් අයෙකු ද වූහ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා නබි වරයකු වශයෙන් තෝරා ගැනීමට පෙර සිට ම දෙදෙනා අතර මිතුරුකමක් විය. එහෙයින් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් ඉස්ලාමය ගැන පැවැසූ විට කිසි දු පැකිලීමකින් තොර ව එතුමාණෝ ඉස්ලාමයට ඇතුළු වූහ. ඒ අනුව පිරිමින්ගෙන් ප්‍රථමයෙන් ම ඉස්ලාමය පිළිගත් කෙනා වශයෙන් සැලකෙන්නේ අබූ බක්ර් රළියල්ලාහු අන්හු තුමන් ය.

හිජ්රි 11 දී නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් වෆාත් වීමත් සමඟ ඉස්ලාමීය රාජ්‍යයේ නායකත්වය ගෙන වසර දෙකක් හා මාස තුනක් ම කිලාෆතය මඟ පෙන්වූහ.

වරක් උමර් හා අබූබක්ර් අතර මතභේදයක් ඇති විය. දෙදෙනා ම නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් ඉදිරියට ආහ. ඔවුන් දුටු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන්ගේ මුහුණ කේන්තියෙන් රතු විය. මෙය දැක බිය වූ අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා "නබි තුමණි සැබවින් ම වරද කළේ මම යි" කී ය. එවිට එහි සිටි අය දෙස බැලූ නබිතුමා "මට වක්තෘත්වය ලැබුණු අවස්ථාවේ ඔබ සියල්ලන් ම මා බොරු කාරයකු යැයි පැවසුව ද අබූබකර් මා සැබෑ කළා. එතුමන්ගේ ආයුෂ, සියලු වස්තු ද දේපළ ද මා වෙනුවෙන් කැප කළා. එවැනි මිත්‍රයන් මගෙන් වෙන් කරන්න ද යන්නේ." කියා දෙවරක් ඇසූහ. මේ සිද්ධියෙන් පසු කිසිවකු එතුමන්ගේ සිත රිදෙන අයුරින් කටයුතු කළේ නැත. අබූ දර්දා රළියල්ලාහු අන්හු තුමා එලෙසින් පවසා ඇත.

ඉස්ලාමය පිළිගත් දිනයේ ම අබූබකර් රළියල්ලාහු අන්හු තුමාණෝ මක්කා-වේ ප්‍රභූන් කිහිප දෙනෙකු නබිතුමා වෙත කැඳවාගෙන පැමිණ ඉස්ලාමයට බැන්දවූහ. ඔවුනතරින් උස්මාන්, තල්හා, සුබයිර්, සඃද් ඉබ්නු අබී වක්කාස්, අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ්, රළියල්ලාහු අන්හුම් වැන්නවුන් වැනි වැදගත් අය වෙති.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මිහ්රාජ් ගමන ඇසූ අවස්ථාවේ දී කිසි දු පැකිලීමකින් තොර ව එය සත්‍ය බව පිළිගත්තේ ය. එනිසා ය, එතුමාණෝ "සිද්දීක් " යන සුවිශේෂ නමින් හඳින්වනු ලැබීය.

මෙවැනි විවිධ සිද්ධීන් අබූබක්ර් තුමාගේ ශ්‍රේෂ්ඨත්වය ගෙන හැර දක්වයි.

## පෞරුෂ ලක්ෂණ.

හිජ්රත් අවස්ථාවේ දී නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට අබූබකර් රළියල්ලාහු අන්හු තුමා සහාය වූයේ ය. අර්බුදකාරී එම අවස්ථාවේ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට නොබිය ව ඔහු සහාය දුන්නේ ය.

නබි නබිසල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ වෆාතය ඇසී සහබාවරුන් ස්ථාවරත්වය නැති වී අධෛර්යට පත් වූ විට, අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා ඉතාමත් ඉවසිලිවන්ත ව ක්‍රියා කළේ ය. ජනතාව සනසා අර්බුදකාරී පරිසරය සාමාන්‍ය තත්ත්වයට ගෙන ආහ. කිලාෆතය භාරගත් අවස්ථාවේ පැවති සංකීර්ණ පරිසරය අධිෂ්ඨානශීලී ව හා දක්ෂ ලෙස සරල කර ගත්තේ ය. එමඟින් සමාජයට මඟ පෙන්වා ඉස්ලාමය හා ඉස්ලාමීය රාජ්‍ය රැක ගත්තේ ය.

මෙසේ ඉස්ලාමය වැළඳගත් ද සිට වෆාත් වන තෙක් තම මුළු කාලය ම ඉස්ලාමය වෙනුවෙන් කැප කළ අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ දයකත්වය එතුමන්ගේ උසස් පෞරුෂත්වයට සාධක ලෙස පවතී.

## කලීෆාවරයා ලෙස පත් කරනු ලැබූ ආකාරය

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා ජීවත් ව සිටින  අවස්ථාවේ කලීෆා තේරීම හෝ පත් කරනු ලැබීම සිදු නොවී ය. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා වෆාත් වූ දිනයේ අන්සාරිවරු හා මුහාජිරීන්වරු සකීෆතු  බනී සාඉදහි දී රැස්වූහ. එහි දී කලීෆා තේරීම සඳහා  සාකච්ඡා කළහ. එම අවස්ථාවේ දී අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා කලීෆාවරයා ලෙස තෝරාගෙන එතුමාට රැස් ව සිටි අය "බෛඅත්" (දිවුරුම් දීම) කළහ.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගෙන් පසු ව කලීෆාවරයා ලෙස පත්කරනු ලැබීමට වඩාත් සුදුස්සා අබූබක්ර් රළියල්ලාහු අන්හු බව පිළිගැනීමට හේතු කිහිපයකි.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අවසාන කාලයේ දී රෝගී ව නැගිටීමට පවා නොහැකි තත්වයකට පත් ව සිටියහ. සලාතය සඳහා අදාන් පැවසූ මොහොතේ යමකුට සලාතය මෙහෙයවන ලෙස  පැවසූහ. උමර් රළියල්ලාහු අන්හු වැනි බොහෝදෙනා සිටිය ද සලාතය මෙහෙයවන ලෙස නියම කළේ අබූබක්ර් තුමාට ය.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා තම අවසාන දිනයේ දී අබ්බාස් රළියල්ලාහු අන්හු හා අලි රළියල්ලාහු අන්හු තුමන්ලගේ කරේ එල්ලෙමින් සලාතය ඉටු කිරීම සඳහා පැමිණියහ. එවිට සලාතය මෙහෙයවමින් සිටි අබූබක්ර් රළියල්ලාහු අන්හු නබිතුමාට  අවස්ථාව සලසා දී සෆ්හි එක්වීමට ගියහ. එය වැළැක්වූ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා තමා ද සෆ්හි එක් වී සලාතය ඉටු කළහ. (බුහාරි)

වරක් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා මගෙන් පසු අබූබක්ර්, උමර් යන දෙදෙනා පිළිවෙළින් ඔබගේ මාර්ගෝපදේශකයන් වශයෙන් පිළිගන්න, යැයි පැවසූහ. (තිර්මිදි)

තවත් වරෙක කාන්තාවක් තම ප්‍රශ්නය පැමිණිලි කිරීමට පැමිණියා ය. වෙනත් අවස්ථාවක තමා හමුවීම සඳහා පැමිණෙන ලෙස නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. එවිට එම කාන්තාව මම පැමිණෙන විට ඔබ අභාවයට ගොස්

සිටියහොත් කුමක් කරන්න දැයි විමසුවා ය. එයට නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ මා නොසිටියහොත් අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා හමුවන්න යැයි කීහ. (බුහාරි)

## සේවා හා දායකත්ව

1. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ වෆාතයෙන් පසු කිලාෆතය බාරගෙන යහ පාලනයක් පැවැත්වීම.
2. ව්‍යාජ නබි වරුන්ගෙන් පැමිණි අභියෝග අත්දැකීම් බහුල සෙන්පතීන් පත් කොට පරාජය කොට කිලාෆතයේ බලය ඔප්පු කිරීම.
3. සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසගේ කුමන්ත්‍රණය බිඳ දැමීම.
4. අල් කුර්ආනය ගොනු කොට ග්‍රන්ථාරූඪ කිරීම.
5. දේශපාලන අත්දැකීම් සහිත ආණ්ඩුකාරවරුන් පත්කොට පාලනය ස්ථාවර කිරීම.
6. දේශ සීමාවල සිටි පාලකයන් නිසා ඉස්ලාමීය රජයට පැවති බලපෑම් අවම කර ගැනීම.
7. තමාගෙන් පසු කලීෆා ලෙස කටයුතු කිරීමට වඩාත් සුදුසු අයකු පත් කිරීම.

ඉස්ලාමීය රාජ්‍ය නායකත්වය පිළිගෙන වසර දෙකක් තුළ එය ස්ථාවර කළ කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා හිජ්රි වසර 13 දී තම 63 වන වියේ දී වෆාත් වූහ.

### පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❁ السِّيْرَةُ وَالتَّارِيْخُ ❁ اَلْخُلَفَاءُ الرَّاشِدُوْنَ ❁ سَقِيْفَةُ بَنِيْ ساعِدَةَ ❁ اَلْخِلَافَةُ ❁ الخَلِيْفَةُ

### අභ්‍යාසය

1. අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාට අස්සිද්දීක් යන සුවිශේෂ නම ලැබීමට හේතු වුයේ කුමක් ද?
2. පළමු කලීෆාවරයගේ පෞරුෂ ලක්ෂණයට නිදර්ශන ලෙස සිද්ධීන් දෙකක් ඉදිරිපත් කරන්න.
3. පළමු කලීෆාවරයා ලෙස පත් කරනු ලැබීමට සුදුස්සා අබූබක්ර් රළියල්ලාහු අන්හු බවට සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
4. අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා කිලාෆතයට ලබා දී තිබූ දායකත්ව දෙකක් ලියන්න.